සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

දෙවන වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2023
Second Term Test - Grade 11 - 2023

ව්‍යවසායකත්ව අධ්‍යයනය - I

කාලය පැය 01 යි

නම/ විභාග අංකයඃ

සැලකිය යුතුයි :

i. සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40 ක් ලැබේ.

ii. අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.

iii. ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.

---

01. මිනිස් චින්තනය හා බැඳුණු මනෝ භාවයකි යනු,
(1) නිෂ්පාදකයා හා බැඳුණු ප්‍රකාශයකි. (2) ව්‍යාපාරිකයා හා බැඳුණු ප්‍රකාශයකි.
(3) ව්‍යවසායකයා හා බැඳුණු ප්‍රකාශයකි. (4) ව්‍යාපාරයක අයිතිකරු හා බැඳුණු ප්‍රකාශයකි.

02. භූමිය නමැති නිෂ්පාදන සාධකයට අයත් සාධක ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) ඉඩම්, වනාන්තර, ගොඩනැගිලි, වැව් (2) ජලාශ, වනාන්තර, පස, ගොඩනැගිලි
(3) ඉඩම් හා ගොඩනැගිලි, වනාන්තර, අමුද්‍රව්‍ය (4) අමුද්‍රව්‍ය, වනාන්තර, සාරවත් පස, හිරු එළිය

03. විශ්වාස හා ආකල්ප කෙරෙහි තදබල ලෙස ගැලී සිටීම,
(1) නවෝත්පාදනයට බාධාකාරී වන සාධකයකි.
(2) නවෝත්පාදනයට පදනම් වන මූලාශ්‍රයකි.
(3) නිර්මාණශීලීත්වයට බාධාකාරී වන සාධකයකි.
(4) නම්‍යශීලීත්වය වර්ධනය කර ගැනීම සඳහා බලපාන සාධකයකි.

04. පවතින සංකල්පයකට සමාන ව නිපද වූ නිර්මාණාත්මක නව නිපැයුමක් බිහි කිරීම අයත් වන්නේ,
(1) සංකල්පයකට ය. (2) අනුකරණය කිරීමකට ය.
(3) නව භාවිතයක් ඇති කිරීමකට ය. (4) නව සොයාගැනීමක් සිදු කිරීමට ය.

05. තමාගේ ගමන් මග හා ගමනාන්තය තමා විසින්ම තීරණය කිරීම හා පාලනය කිරීමට ඇති හැකියාව හඳුන්වන්නේ,
(1) කැපවීම ලෙසය. (2) ස්වයං පෙළඹීම ලෙසය.
(3) ආත්ම විශ්වාසය ලෙසය. (4) ස්වාධීනත්වය ලෙසය.

06. ''පෙනිසිලින්'' සොයා ගැනීම අයත් වන්නේ,
(1) අනපේක්ෂිත සිදුවීමකට ය. (2) අත්හදා බැලීමකට ය.
(3) නව සොයා ගැනීමකට ය. (4) දැනුම පදනම්කරගත් සංකල්පයකට ය.

07. ස්වකීය සාර්ථකත්වය තමා අනුව තීරණය වන බවට ඇති විශ්වාසය තහවුරු කිරීම සඳහා ඇති හොඳම උදාහරණය වන්නේ,
(1) ජෙසිකා කොක් මහත්මිය (2) තෝමස් අල්වා එඩිසන් මහත්මා
(3) මාරි කියුරි මැතිනිය (4) ඇලෙක්සැන්ඩර් ග්‍රැහැම් බෙල්

08. ව්‍යවසායකයකු තුළ පොදුවේ දැකිය හැකි ගතිලක්ෂණ පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) දැක්ම, කැපවීම, ආත්ම විශ්වාසය
(2) කැපවීම, ස්වාධීනත්වය, නම්‍යශීලීත්වය
(3) නිර්මාණශීලීත්වය, දැඩි ආශාව, ආත්ම විශ්වාසය
(4) සාමාන්‍ය වැටහීම, ස්වයං පෙළඹීම, ආත්ම විශ්වාසය

09. සමජාතීය බව ආරක්ෂා කළ නොහැකි වීම යනු,
(1) භාණ්ඩයක දැකිය හැකි ලක්ෂණයකි. (2) සේවාවක දැකිය හැකි ලක්ෂණයකි.
(3) නිෂ්පාදනයක දැකිය හැකි ලක්ෂණයකි. (4) නිෂ්පාදිතයක දැකිය හැකි ලක්ෂණයකි.

10. අවදානමකට මුහුණදීම යනු,
(1) ව්‍යාපාරිකයාගේ ගති ලක්ෂණයකි.
(2) ව්‍යවසායකයාගේ ගති ලක්ෂණයකි.
(3) ව්‍යාපාරවල පවතින ගති ලක්ෂණයකි.
(4) ව්‍යාපාරිකයා හා ව්‍යවසායකයා අතර ඇති සමානකමකි.

11. සමාජයේ ප්‍රශ්නවලට නිර්මාණාත්මකව විසඳුම් ඉදිරිපත් කිරීමට ඉදිරිපත් වන ව්‍යවසායකයෝ හඳුන්වන්නේ,
(1) සමාජයීය ව්‍යවසායකයෝ ලෙසය. (2) නිර්මාණශිලී ව්‍යවසායකයෝ ලෙසය.
(3) නම්‍යශිලී ව්‍යවසායකයෝ ලෙසය. (4) ස්වයංපෝෂිත ව්‍යවසායකයෝ ලෙසය.

12. තරගය අභියෝගයක් ලෙස සලකන්නේ,
(1) ව්‍යාපාරිකයින් විසිනි. (2) වෙළෙන්දන් විසිනි.
(3) ව්‍යවසායකයින් විසිනි. (4) නිෂ්පාදකයින් විසිනි.

13. සිල්ලර වෙළඳ ව්‍යාපාරිකයා,
(1) සමාජයීය ව්‍යවසායකයෙකි. (2) සාධාරණ ව්‍යවසායකයෙකි.
(3) ව්‍යාපාර ව්‍යවසායකයෙකි. (4) ප්‍රාදේශීය ව්‍යවසායකයෙකි.

14. සමාජීය වශයෙන් ඇතිවන පිළිගැනීම,
(1) සමාජයට ලැබෙන ප්‍රතිලාභයකි. (2) ව්‍යවසායකයාට හිමිවන ප්‍රතිලාභයකි.
(3) ආර්ථිකයට හිමිවන ප්‍රතිලාභයකි. (4) ව්‍යාපාරිකයින්ට හිමිවන ප්‍රතිලාභයකි.

15. ආදායම් බෙදීයාමේ විෂමතාව අඩුවීම යනු,
(1) සුළු පිරිසක් අතර වැඩි ආදායමක් බෙදී යාමයි.
(2) සියලු ම දෙනා අතර ආදායම් සමානව බෙදී යාමයි.
(3) වැඩි ආදායම් ප්‍රමාණයක් වැඩි පිරිසක් අතර බෙදී යාමයි.
(4) සුළු පිරිසක් අතර සුළු ආදායම් ප්‍රමාණයක් බෙදී යාමයි.

16. කුඩා පරිමාණ ව්‍යාපාරවල දැකිය හැකි ලක්ෂණයකි.
(1) ව්‍යාපාරයේ සේවයේ නිරත සේවක සංඛ්‍යාව ඉහළ වීම.
(2) වැඩි ප්‍රාග්ධනයක් ව්‍යාපාරයේ ආයෝජනය කර තිබීම.
(3) ව්‍යාපාර කටයුතු විශාල ප්‍රදේශයක ව්‍යාප්තව තිබීම.
(4) ව්‍යාපාරය පවත්වාගෙන යාමේ දී තීරණ ගැනීමට පහසු වීම.

17. කුඩා පරිමාණ ව්‍යාපාර ආශ්‍රිතව පවතින සීමාවක් වන්නේ,
(1) නවීන තාක්ෂණය භාවිතයට ගැනීම. (2) වෙළෙඳ පොළ ඉතා පුළුල් වීම.
(3) තරඟකාරීත්වයට මුහුණදීමට පහසු වීම. (4) ප්‍රාග්ධන සම්පාදන මාර්ග අඩු වීම.

18. ව්‍යවසායකයකු අයිතිකරුගේ භූමිකාව යටතේ ඉටුකරනු ලබන කාර්යයක් වන්නේ,
(1) සේවකයින්ව මෙහෙයවීම. (2) සේවකයින්ව කාර්යයේ නිරත කරවීම.
(3) ව්‍යාපාර සැලසුම් සැකසීම (4) ව්‍යාපාරයට අවශ්‍ය සම්පත් මිලදී ගැනීම.

19. ව්‍යාපාර කටයුතු කරගෙන යාමට අවශ්‍ය වන යන්ත්‍රයක් නිවැරදිව ස්ථාන ගත කර ක්‍රියාත්මක කිරීම, අලුත්වැඩියා කිරීමට ඇති හැකියාව හඳුන්වන්නේ,
   (1) තාක්ෂණික කුසලතා ලෙස ය. (2) නිර්මාණශීලී කුසලතා ලෙස ය.
   (3) නවෝත්පාදන කුසලතා ලෙස ය. (4) අවදානම් දරාගැනීමේ කුසලතා ලෙස ය.

20. නූතන ව්‍යාපාර පරිසරයේ දැකිය හැකි ලක්ෂණයකි.
   (1) පාරිභෝගිකයෝ බලවත් වීම. (2) තරඟකාරීත්වය පහත මට්ටමක පැවතීම.
   (3) ලාභය ප්‍රධාන ම අරමුණ වීම. (4) වෙනස් වීමේ වේගය අඩු වීම.

21. ව්‍යාපරයක කාර්යයන්හි නිරත වන පුද්ගලයින් හඳුන්වන්නේ,
   (1) අයිතිකරුවන් ලෙස ය. (2) සේවකයින් ලෙස ය.
   (3) කළමනාකරුවන් ලෙස ය. (4) සුපරීක්ෂකවරුන් ලෙස ය.

22. මැණික් ගැරීම, හුණුගල් කැඩීම, මිනිරන් කැඩීම යන ව්‍යාපාර ක්ෂේත්‍ර අයත් වන්නේ,
   (1) කර්මාන්ත අංශයට ය. (2) ව්‍යාපාරික අංශයට ය.
   (3) නිෂ්පාදන අංශයට ය. (4) ප්‍රාථමික අංශයට ය.

23. භාවිත යෙදවුම් වර්ගයක් වෙනුවට වෙනත් දෑ යොදා ගැනීම අයත් වන්නේ,
   (1) ආදේශ කිරීමකට ය. (2) යළි සකස් කිරීමකට ය.
   (3) සම්බන්ධ කිරීමකට ය. (4) වෙනත් කාර්යයකට භාවිත කිරීමකට ය.

24. වෙළඳපොළෙහි පාරිභෝගිකින්ගෙන් කොටසක් තෘප්තිමත් නොවූ අවශ්‍යතා හා වුවමනාවලින් පෙළීම හඳුන්වන්නේ,
   (1) තෘප්තිමත් නොවූ පාරිභෝගිකයින් ලෙස ය. (2) කනස්සල්ලෙන් පසුවන පාරිභෝගිකයා ලෙස ය.
   (3) වෙළෙඳපොළ හිඩැස ලෙස ය. (4) වෙළෙඳපොල පරාසය ලෙස ය.

25. හොඳ ව්‍යාපාර අදහසක ලක්ෂණයකි.
   (1) ඉල්ලුමක් පැවතීම (2) නීතිරීතිවලට අනුකූල වීම
   (3) ආකර්ශනීය ඉපයුමක් තිබීම. (4) මුහුණදෙන අවදානම අවම කර ගත හැකි වීම.

26. නව සොයාගැනීමක් වෙනුවෙන් රජය ලබාදෙන සහතිකය හඳුන්වන්නේ,
   (1) පේටන් බලපත්‍රය ලෙසය. (2) තත්ව සහතිකය ලෙස ය.
   (3) ගුණත්ව සම්මානය ලෙසය. (4) ඵලදායීතා සම්මානය ලෙසය.

27. ව්‍යාපාර සැලැස්මක අන්තර්ගත වන මූලිකාංගයකි.
   (1) විකුණුම් පුරෝකථනය (2) විධායක සාරාංශය
   (3) වෙළෙඳපොල විශ්ලේෂණය (4) සේවක වැටුප් හා වේතන

28. ව්‍යාපරයක අරමුදල් සම්පාදනය හා යෙදවීම සම්බන්ධ තොරතුරු ඇතුළත් කරනු ලබන්නේ,
   (1) විකුණුම් සැලැස්මෙහි ය. (2) අලෙවි සැලැස්මෙහි ය.
   (3) මූල්‍ය සැලැස්මෙහි ය. (4) පරිපාලන සැලැස්මෙහි ය.

29. අලෙවිකරණ මිශ්‍රයේ ප්‍රධාන විචල්‍යයන් (4Ps) ඇතුළත් පිළිතුර තෝරන්න.
   (1) නිෂ්පාදනය, මිල ස්ථානය, ප්‍රවර්ධනය (2) නිෂ්පාදනය, මිල, ප්‍රවර්ධනය, ස්ථානය
   (3) නිෂ්පාදනය, ප්‍රචාරණය, ප්‍රවර්ධනය, මිල (4) ප්‍රචාරණය, නිෂ්පාදිතය, මිල, ප්‍රවර්ධනය

30. සුනිමල් ආරම්භ කිරීමට නියමිත සිල්ලර වෙළඳ ව්‍යාපාරය සඳහා විදුලි සබඳතාව ලබා ගැනීම සඳහා දැරීමට නියමිත වියදම,
   (1) මූල්‍ය වියදමකි. (2) පරිපාලන වියදමකි.
   (3) ආයතනික වියදමකි. (4) ආරම්භ කිරීමට පෙර දැරීමට නියමිත වියදමකි.

31. නිෂ්පාදනය කිරීමේ හා අලෙවි කිරීමේ නිරත වන ව්‍යාපාරයක නිෂ්පාදන ස්ථාවර වත්කමක් වන්නේ,
(1) කාර්යාල උපකරණ ය.
(2) කර්මාන්ත ශාලා ගොඩනැගිල්ල ය.
(3) අලෙවි කටයුතු සඳහා යොදාගන්නා මෝටර් රථ ය.
(4) අලෙවි කටයුතු සඳහා යොදාගන්නා ප්‍රදර්ශනාගාරය ය.

32. යෝජිත ව්‍යාපාරයක අපේක්ෂිත ප්‍රතිඵල ගණනය කිරීමේ ලේඛනය සකස් කිරීම සඳහා භාවිත කෙරෙන මුදල් ගලා ඒමක් වන්නේ,
(1) අයිතිකරුගේ ආයෝජනයයි. (2) බැංකු ණය ලබාගැනීමයි.
(3) ණයගැතියකුගෙන් මුදල් ලැබීමයි. (4) අපේක්ෂිත අලෙවි ආදායමයි.

33. බීම නිෂ්පාදන ව්‍යාපාරයක සේවකයින්ගේ වැටුප් ඇස්තමේන්තුව ඇතුළත් වන්නේ,
(1) නිෂ්පාදන සැලැස්මෙහි ය. (2) මූල්‍ය සැලැස්මෙහි ය.
(3) පරිපාලන සැලැස්මෙහි ය. (4) ව්‍යාපාර සැලැස්මෙහි ය.

34. සමන්ත විසින් ආරම්භ කිරීමට නියමිත විශ්‍රාමිකයින් සඳහා වූ සුරකුම් මධ්‍යස්ථානය පිළිබඳව සමස්ත අවබෝධයක් ලබා ගැනීමට අධ්‍යයනය කළ යුත්තේ,
(1) මූල්‍ය සැලැස්මයි. (2) පරිපාලන සැලැස්මයි.
(3) විධායක සාරාංශයයි. (4) නිෂ්පාදන සැලැස්මයි.

35. සේවා සැපයීමේ ව්‍යාපාරයක නිරත වන සහන්ට ශ්‍රී ලංකා ආර්ථිකයේ ණය පොළී අනුපාතය පහළ යාම බලපාන්නේ,
(1) ශක්තික් ලෙස ය. (2) අවස්ථාවක් ලෙස ය.
(3) දුර්වලතාවයක් ලෙස ය. (4) තර්ජණයක් ලෙස ය.

36. ව්‍යවසායකයකු තුළ ව්‍යාපර අදහස් ජනනය වීම සඳහා කැමැත්ත මෙන්ම අනිවාර්යයෙන් ම පැවතිය යුතු ලක්ෂණයක් වන්නේ,
(1) නවෝත්පාදනීය බවයි. (2) දෑඩි අධිෂ්ඨානශීලී බවයි.
(3) නිර්මාණශීලී බවයි. (4) නම්‍යශීලී බවයි.

පහත දැක්වෙන්නේ කසුන් විසින් ආරම්භ කිරීමට යෝජිත පාසල් බෑග් නිෂ්පාදන ව්‍යාපාරකයට සම්බන්ධ ඇස්තමේන්තුගත තොරතුරුය. **ඒ ඇසුරින් 37 සිට 40 දක්වා වූ ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

අයිතමය	වියදම රු.
ගොඩනැගිල්ල	1 000 000
ලී බඩු	100 000
උපකරණ	50 000
රෙදි කපන යන්ත්‍රය	200 000
වෙළෙඳපල සමීක්ෂණ වියදම්	20 000
ව්‍යාපාර නාමය ලියාපදිංචි ගාස්තු	5 000
ව්‍යාපාර සැලැස්ම සැකසීමට	15 000
විදුලි සබඳතා ලබා ගැනීමට	25 000
දෛනික ව්‍යාපාර කටයුතු සඳහා	140 000

37. කසුන් විසින් ආරම්භ කිරීමට නියමිත ව්‍යාපාරයේ මුළු ස්ථාවර වත්කම් වල වටිනාකම වන්නේ,
(1) රු. 350 000 කි. (2) රු. 375 000 කි. (3) රු. 540 000 කි. (4) රු. 1 350 000 කි.

38. කසුන්ගේ ව්‍යාපාරය සඳහා ව්‍යාපාරය ආරම්භ කිරීමට පෙර දැරීමට නියමිත විදයම වන්නේ,
(1) රු. 5 000 කි. (2) රු. 25 000 කි. (3) රු. 40 000 කි. (4) රු. 65 000 කි.

39. කසුන් විසින් කාරක ප්‍රාග්ධනය සඳහා දැරීමට අපේක්ෂිත මුදල වන්නේ,
(1) රු. 140 000 කි. (2) රු. 165 000 කි. (3) රු. 180 000 කි. (4) රු. 205 000 කි.

40. කසුන් විසින් තම ව්‍යාපාරය සඳහා දැරීමට අපේක්ෂිත මුළු ආයෝජනය වන්නේ,
(1) රු. 65 000 කි. (2) රු. 140 000 කි. (3) රු. 1 540 000 කි. (4) රු. 1 555 000 කි.

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

දෙවන වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2023
Second Term Test - Grade 11 - 2023

ව්‍යවසායකත්ව අධ්‍යයනය - II

කාලය පැය 02 යි

නම/ විභාග අංකය:

- **පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.**
- **පළමු ප්‍රශ්නයට ලකුණු 20 යි. තෝරාගන්නා අනෙක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් හිමි වේ.**

---

(01) රුවන්තිකා ඉතා අධිෂ්ඨානශීලී, දැඩි කැපවීමෙන් කටයුතු කරන ඕනෑම අවදානමකට නොබියව මුහුණ දීමට කැමති, නිර්මාණශීලී තරුණියක වූ අතර, ඇය මූලික පාසල් අධ්‍යාපනය අවසන් කළ පසු තමාගේම ව්‍යාපාරයක් ආරම්භ කිරීමේ දැඩි ආශාවෙන් පසුවිය. පාසල් අධ්‍යාපන කාලය තුලදී ඇය අ.පො.ස (සාමාන්‍ය පෙළ) අධ්‍යයනය කටයුතු හදාරන විට ව්‍යවසායකත්ව විෂය හැදෑරීමේදී ඇති වූ ආශාව සහ ලැබූ දැනුම මත පරිසර විශ්ලේෂණය කිරීම ව්‍යාපාරය ආරම්භ කිරීම සඳහා පූර්ව අවශ්‍යතාවයක් බව රුවන්තිකා දැන සිටියා ය.

අ.පො.ස (උසස් පෙළ) අවසන් කළ ඈ රූපලාවන්‍ය පිළිබඳ හැදෑරීමට ආශා කල බැවින් ඒ සම්බන්ධ පාඨමාලාවක් හදාරන අතර තුර තම ප්‍රදේශයේ රූපලාවන්‍යාගාරයක පුහුණුවද ලැබීය. එහිදී ඇය හඳුනාගත්තේ බොහෝ තරුණ, තරුණියන් රූපලාවන්‍යාගාර වෙත පිවිසෙන විට හම පැහැපත් කරගැනීම පිළිබඳ තොරතුරු විමසන බවත් ඒ සඳහා ප්‍රමිතියෙන් තොර ආලේපන භාවිතා කරන බවත්ය.

ඇයට ස්භාවික ප්‍රතිකාර ක්‍රම පිළිබඳව වැඩි ආසාවක් පැවති නිසා සම පැහැපත් වීම සඳහා සුදුසු පානයක් සකස් කිරීමේ ව්‍යාපාරයක් පිළිබඳව අදහසක් ඇති විය. ඇය වද මල් පානයක් සකස් කර වෙළඳපොළට ඉදිරිපත් කිරීමට අවශ්‍ය වෙළෙඳපොල විශ්ලේෂණය සිදුකල අතර ඇගේ පවුලේ සාමාජිකයන්ද ඇයට විශාල සහයෝගයක් ලබා දීමට බලාපොරොත්තුවෙන් සිටින බව ඇයට වැටහුණි.

(i) රුවන්තිකා තුල දක්නට ලැබෙන ව්‍යවසායකත්ව ලක්ෂණ හතරක් ලියන්න.

(ii) ඇය මෙම ව්‍යාපරය ආරම්භ කිරීම තුලින් ඇයට ලැබිය හැකි ප්‍රතිලාභ දෙකක් ලියන්න.

(iii) රුවන්තිකාගේ ව්‍යාපාරය තුලින් ඉටුකරනු ලබන අවශ්‍යතාවය කුමක්ද? ඒ සඳහා ඉදිරිපත් කරන නිෂ්පාදනය කුමක්ද?

(iv) ඇයට ව්‍යාපාරය ආරම්භ කිරීමට හේතු වූ ව්‍යාපාර අදහස් මූලාශ්‍රය කුමක්ද?

(v) ඇයගේ ඉලක්කගත පාරිභෝගික කණ්ඩායම කවුද?

ඉහත සිද්ධියට අදාළ රුවන්තිගේ ව්‍යාපාරයේ ඉදිරි මාසය සඳහා වූ තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

අයිතම	වටිනාකම (රු.)
විකුණුම් ආදායම	2 500 000
අමුද්‍රව්‍ය පිරිවැය	1 000 000
ශ්‍රම පිරිවැය	200 000
වෙනත් නිෂ්පාදන පිරිවැය	90 000
පරිපාලන වියදම්	49 000
බැංකු ණය	500 000
විකුණුම් වියදම්	25 000

(vi) ඉදිරි මාසය සඳහා වූ ප්‍රතිඵල ගණනය කිරීමේ ලේඛනය සකස් කරන්න.

(vii) ඉදිරි මාසය සඳහා මුළු නිෂ්පාදන පිරිවැය ගණනය කරන්න.

(viii) ඉදිරි මාසය සඳහා මුළු නිෂ්පාදන නොවන පිරිවැය ගණනය කරන්න.

(ix) ඉදිරි මාසය සඳහා වූ ශුද්ධ ලාභය ගණනය කරන්න.

(x) මුදල් ගලා ඒම සහ ගලායාම් සඳහා උදාහරණ 02 බැගින් ලියන්න. (මුළු ලකුණු 20 යි.)

(02) (i) ව්‍යවසායකයෙකු හා ව්‍යාපාරිකයෙකු අතර දැකිය හැකි සමානතා හතරක් ලියන්න.
(ii) ''ආදායම වැඩි වන විට ප්‍රතිලාභය වැඩිවන බව පැවසේ.'' අවදානම හා ප්‍රතිලාභය අතර සම්බන්ධතාවය පැහැදිලි කරන්න.
(iii) වර්තමාන සමාජය තුළ දැකිය හැකි ව්‍යවසායකයින් වර්ග දෙකක් නම් කර ඉන් එකක් පැහැදිලි කරන්න.
(iv) ව්‍යවසායකයෙකුට සමාජීය සුභසාධනය සඳහා දායක විය හැකි ආකාර හතරක් ලියන්න.
(v) ස්වාධීනත්වය ලෙස හඳුන්වන්නේ කුමක්ද? (ල. 2 x 5 = 10)

(03) (i) කුඩා පරිමාණ ව්‍යාපාර තුළින් ආර්ථික සංවර්ධනයට ලැබෙන දායකත්වයන් හතරක් ලියන්න.
(ii) කුඩා පරිමාණ ව්‍යාපාර තුළින් ලොව ජයගත් ශ්‍රී ලාංකිකයන් දෙදෙනෙක් ලියන්න.
(iii) ව්‍යවසායකත්ව භූමිකා නම් කර, ඉන් එකක් පැහැදිලි කරන්න.
(iv) ව්‍යවසායකයෙකු සතු විය යුතු සංකල්පණාත්මක කුසලතා යන්නෙන් කුමක් අදහස් කරන්නේද? පහදන්න.
(v) වර්තමාන ව්‍යාපාර පරිසරය තුළ ඇති සැබෑ වෙනස්කම් අවබෝධ කර ගැනීම තුළින් ව්‍යවසායකයාට අත්වන ප්‍රයෝජන හතරක් ලියන්න. (ල. 2 x 5 = 10)

(04) (i) ශ්‍රී ලංකාවේ සුලභ සම්පත් අතරින් මානව නොවන සම්පත් සඳහා උදාහරණ හතරක් ලියන්න.
(ii) එම ව්‍යාපාරිකයෙකුට ප්‍රාග්ධනය සම්පාදනය කරගත හැකි ක්‍රම මොනවාද?
(iii) ව්‍යාපාර සැලැස්මක් අවශ්‍ය වන්නේ ඇයි ? හේතු දෙකක් ලියන්න.
(iv) වෙළෙඳපොල විශ්ලේෂණය මූලික පරමාර්ථය වන්නේ කුමක්ද?
(v) අලෙවි ස්ථාවර වත්කම් යන්න උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ල. 2 x 5 = 10)

(05) (i) නිෂ්පාදන සැලැස්මක ඇතුළත් අංග 04 ක් ලියන්න.
(ii) නිෂ්පාදන ක්‍රියාවලිය නිදසුනක් මගින් පැහැදිලි කරන්න.
(iii) පරිපාලන සැලැස්මක අවශ්‍යතාව පැහැදිලි කරන්න.
(iv) මලිත් පෙරේරා ඇගළුම් කර්මාන්තශාලා හිමිකරුවෙකි. ඔහුගේ ව්‍යාපාරයේ නිෂ්පාදනය කරනු ලබන ටී ෂර්ට් සඳා වූ නිෂ්පාදන පිරිවැය ගණනය කිරීම සඳහා යොදා ගනු ලබන පිරිවැය අයිතම සඳහා නිදසුන් හතරක් දක්වන්න.
(v) ඉහත මලිත්ගේ ව්‍යාපාරයේ සංවිධාන ව්‍යුහය තුළ දැකිය හැකි තනතුරු හතරක් ලියන්න. (ල. 2 x 5 = 10)

(06) (i) ඕනෑම ව්‍යාපාර සංවිධානයක පොදුවේ දක්නට ලැබෙන ලක්ෂණ දෙකක් ලියන්න.
(ii) හිමිකාරීත්වය හා අරමුණ අනුව ව්‍යාපාර සංවාධාන වර්ග කර දක්වන්න.
(iii) හවුල් ඔප්පුව යනුයෙන් හඳුන්වන්නේ කුමක්ද?
(iv) වරලත් ව්‍යාපාර හා සම්බන්ධ ප්‍රධාන පාර්ශවයන් නම් කරන්න.
(v) ව්‍යාපාරයක් සමාජ වගකීම පිළිපැදීමෙන් ලැබෙන ප්‍රතිලාභ දෙකක් ලියන්න. (ල. 2 x 5 = 10)

(07) මල්ෂා තනි පුද්ගල ව්‍යාපාරයක් ආරම්භකර පවත්වාගෙන යාමට අපේක්ෂා කරන අතර ඇයගේ ව්‍යාපාරයේ ව්‍යාපාර සැලැස්මෙන් උපුටා ගන්නා ලද තොරතුරු පහත දැක්වේ.

අයිතිකරු යොදන මුදල	1 000 000
බැංකු ණය	200 000
අපේක්ෂිත විකුණුම් (මුදලට)	900 000
අපේක්ෂිත විකුණුම් (ණයට)	600 000
ණය වාරික ගෙවීම	150 000
විදුලි බිල්පත් ගෙවීම	40 000
දුරකථන ගාස්තු	18 000
උපකරණ මිලට ගැනීම	200 000
සේවක වැටුප් ගෙවීම	300 000

අවශ්‍ය වන්නේ,
(i) මල්ෂාගේ ව්‍යාපාරයේ ඇස්තමේන්තුගත මුදල් ප්‍රවාහ ප්‍රකාශය (ල. 07)
(ii) මල්ෂාගේ ව්‍යාපරයේ මුදල් ශේෂය (ල. 01)
(iii) මල්ෂා ආරම්භ කිරීමට බලාපොරොත්තු වන ව්‍යාපාරයේ මූලික ලක්ෂණ හතරක් ලියන්න. (ල. 02)

පිළිතුරු පත්‍රය -

1 - (3)	11 - (1)	21 - (2)	31 - (4)
2 - (4)	12 - (3)	22 - (4)	32 - (4)
3 - (3)	13 - (3)	23 - (1)	33 - (3)
4 - (2)	14 - (2)	24 - (3)	34 - (3)
5 - (4)	15 - (2)	25 - (4)	35 - (2)
6 - (1)	16 - (4)	26 - (1)	36 - (3)
7 - (1)	17 - (4)	27 - (2)	37 - (4)
8 - (4)	18 - (4)	28 - (3)	38 - (4)
9 - (2)	19 - (1)	29 - (2)	39 - (1)
10 - (4)	20 - (1)	30 - (4)	40 - (4)

(නිවැරදි පිළිතුරකට ලකුණු 01 බැගින්)

I කොටස

(01) (i) නවෝත්පාදනය, නිර්මාණශීලීත්වය, අවදානම් දැරීම, කැපවීම. (එක් ලක්ෂණයකට ½ බැගින් ලක්ෂණ හතරකට ල. 02 යි)

(ii)
- ආකර්ෂණීය ලාභයක් ඉපයිය හැකි වීම.
- ස්වයං පෝෂිත බව
- ස්වකීය දෛවය තමා මත රඳා පැවතීම
- නිදහස හා ඉහළ තෘප්තිය
- ප්‍රයෝජනයට නොගත් හැකියා වලින් ප්‍රයෝජන ලබාගත හැකි වීම. (එක් කරුණකට ලකුණු 01 බැගින් කරුණු 02 ට ල. 02 යි.)

(iii)
- සෞඛ්‍යය අවශ්‍යතාවය (ල. 01)
- වදමල් පානය (ල. 01)

(iv) විනෝදාංශ හා ලැදියා හෝ අධ්‍යාපනික පාඨමාලා තුලින් (එක් පිළිතුරකට ල. 2)

(v) තරුණ තරුණියන් (ල. 02)

(vi)

රුවන්තිගේ ව්‍යාපාරයේ ½
ඉදිරි මාසය සඳහා අපේක්ෂිත ප්‍රතිපල ගණනය කිරීමේ ලේඛනය

විකුණුම් ආදායම් ½		2 500 000
අඩුකලා - මුළු නිෂ්පාදන පිරිවැය ½		
අමුද්‍රව්‍ය පිරිවැය	1 000 000	
ශ්‍රම පිරිවැය	200 000	
වෙනත් නිෂ්පාදන පිරිවැය	90 000	(1 290 000)
		1 210 000
අඩුකලා - නිෂ්පාදන නොවන පිරිවැය ½		
පරිපාලන වියදම්	49 000	
විකුණුම් වියදම්	25 000	(74 000)
ශුද්ධ ලාභය		1 136 000

(ලකුණු ½ බැගින් අයිතම 04 දක්වා ලේඛනය ඇඳ ඇත්නම් ල. 02 යි.)

(vii) රු. 1 290 000/- (ල. 02) හෝ

අමුද්‍රව්‍ය	1 000 000	½
ශ්‍රමය	200 000	½
වෙනත් නිෂ්පාදන	90 000	½
	1290 000	½

(viii) රු. 74 000/- (ල. 02) හෝ

පරිපාලන වියදම්	49 000	½
විකුණුම් වියදම්	25 000	½
	74 000	1

(ix) රු. 1136 000/- (ල. 02)

(x) මුදල් ගලා ඒම්
විකුණුම් ආදායම්
බැංකු ණය

මුදල් ගලා යාම්
අමුද්‍රව්‍ය පිරිවැය
ශ්‍රම පිරිවැය
වෙනත් පිරිවැය
පරිපාලන වියදම්
විකුණුම් වියදම්

මුදල් ගලා ඒම් එකකට ½ බැගින් ගලා ඒම් 02 ට ල. 01 යි.
මුදල් ගලා යාම් එකකට ½ බැගින් ගලා යාම් 02 ට ල. 01 යි. (මුළු ලකුණු $2 \times 10 = 20$)

(02) (i)
- ආර්ථික කටයුත්තක යෙදීම.
- අවදානමකට මුහුණ දීම.
- ගනුදෙනුවල නිරත වීම.
- සම්පත් භාවිත කිරීම.
- නිෂ්පාදන මිලදී ගැනීම හා විකිණීම සම්බන්ධ තීරණ ගැනීම.
- තරඟයට මුහුණ දීම.
- පැවැත්ම ගැන සිතීම.
- ස්වයං පෙළඹවීමක් තිබීම.

(කරුණු එකකට ½ බැගින් කරුණු 4 ට ල. 02 යි.)

(ii) ආදායම හා ප්‍රතිලාභය අතර අනුලෝම සම්බන්ධතාවයක් පවතී.
අවදානම ඉහළ නම් ප්‍රතිලාභ ද ඉහළ වේ.
අවදානම පහළ නම් ප්‍රතිලාභයද පහළ වේ. (මෙම කරුණු ඇතුළත් පිළිතුර පැහැදිලි කිරීමකට ල.. 02 යි.)

(iii)
- ව්‍යාපාර ව්‍යවසායකයෝ
- සමාජීය ව්‍යවසායකයෝ
- අභ්‍යන්තරික (ආයතනික) ව්‍යවසායකයෝ

(ඕනෑම ව්‍යවසායකයින් වර්ග 02 කට එකකට ½ බැගින් ල. 01 යි.)
(නිවැරදි ලෙස පැහැදිලි කර ඇත්නම් ල. 01 යි.)

(iv) ගැලපෙන ඕනෑම ආකාර එකකට ½ බැගින් කරුණු 4 ට ල. 02 යි.

(v) ස්වාධීනත්වය - ව්‍යවසායකයෝ ස්වයං පාලනයකින් යුක්තය. තමගේ අභිමතය පරිදි වැඩ කිරීමට තීරණ ගැනීමට අවශ්‍ය නිදහස ඇති බව. (අදහස පවතීනම් ල. 02 යි.) (මුළු ලකුණු $2 \times 5 = 10$)

(03) (i)
- සේවා නියුක්තිය වැඩි වීම.
- ජාතික නිෂ්පාදනය වැඩි වීම.
- ආදායම් බෙදීයාමේ විෂමතාවය අඩු වීම.
- මහා පරිමාණ ව්‍යාපාර තුළින් නොසපයන භාණ්ඩ හා සේවා සැපයීම
- කාලයාගේ ඇවෑමෙන් මහා පරිමාණ ව්‍යාපාර බවට පත්වීම.
- දේශීය දැනුම හා සම්පත් භාවිතයට ගැනීම.

(කරුණු එකකට ½ බැගින් ඕනෑම කරුණු 04 ට ල. 2 යි.)

(ii) ගැලපෙන පිළිතුරු එකකට 01 බැගින් දෙදෙනෙකු නම් කර ඇත්නම් ල. 2 යි.

(iii) අයිතිකරුගේ භූමිකාව
කළමනාකරුගේ භූමිකාව
නායකත්ව භූමිකාව
(භූමිකා නම් කිරීමට ½ බැගින් 1½ යි.) (එකක් පැහැදිලි කිරීමට ½ යි.)

(iv) අතීතයේදී ව්‍යාපාර කටයුතු සාර්ථක කර ගැනීමට අවශ්‍ය තීරණ ගැනීම ඒවා වැඩි දියුණු කිරීම සහ ඊට අවශ්‍ය උපාය මාර්ග තීරණය කොට ක්‍රියාත්මක කිරීම වැනි කාර්ය කිරීමට ව්‍යවසායකයෙකුට ඇති හැකියාව සංකල්පණාත්මක කුසලතා වේ. (අදහස කියැවේ නම් ල. 2 යි.)

(v)
- ව්‍යාපාරය සතු ශක්තීන්, දුර්වලතා හඳුනා ගැනීම.
- පරිසරයේ පවතින විවිධ ව්‍යාපාර අවස්ථා හඳුනාගැනීම.
- ව්‍යාපාරයට මුහුණ දීමට සිදුවන තර්ජන හඳුනාගත හැකි වීම.
- පරිසර වෙනස්වීම්වලට ගැලපෙන පරිදි නිෂ්පාදන හා අලෙවි කටයුතු පවත්වාගෙන යාමඳ
- පරිසර වෙනස්වීම් වලට අනුව සැලසුම් සකස් කිරීම හා උපායමාර්ග තීරණය.

(එකකට ½ බැගින් කරුණු 4 ට ල. 02 යි.) (මුළු ලකුණු $2 \times 5 = 10$)

(04) (i) ගැලපෙන උදාහරණ එකකට ½ බැගින් ල. 02 යි.

(ii)
- ස්වයකීය ඉතුරුම්
- ස්වකීය වත්කම් යෙදවීම
- නෑදෑ මිතුරන්ගෙන්
- බැංකු ණය (ගැලපෙන පිළිතුරකට)

(එක් පිළිතුරකට ල. ½ බැගින් පිළිතුරු 4 ට ල. 02 යි.)

(iii)
- ව්‍යාපාර අදහස පැහැදිලි කිරීමට.
- ව්‍යාපාරය සඳහා මඟ පෙන්වීමට.
- ව්‍යාපාර පරිසර පිළිබඳ අවබෝධකර ගැනීමට.
- ව්‍යාපරයේ අනාගත දිශාව පෙන්වා දීමට.
- අරමුදල් සම්පාදනය කර ගැනීමට.
- ව්‍යාපරයට අවශ්‍ය සම්පත් හඳුනාගැනීමට.
- වෙළෙඳපල පිළිබඳ හොඳ තක්සේරුවක් ලබාගැනීමට.

(එක් හේතුවකට ල. 01 බැගින් හේතු 02 ට ල. 02 යි.)

(iv) අලෙවි සැලැස්ම වඩාත් නිවැරදිව පිළියෙල කර ගැනීමට අවශ්‍යය තොරතුරු ලබා ගැනීමයි. (ල. 02)

(v) ව්‍යාපාරයේ අලෙවි හා බෙදාහැරීමේ කාර්යයන්ට සෘජුවම අදාළ වන ස්ථාවර වත්කම් අලෙවි ස්ථාවර වත්කම් වේ. උදා:- අලෙවි හා බෙදාහැරීම් කාර්යයන්ට භාවිත කරන ඉඩම්, ගොඩනැගිලි, උපකරණ හා වාහන, කාර්යාල උපකරණ හා ලී බඩු

(හැඳින්වීමට ල. 01 යි, උදාහරණ දැක්වීමට ල. 01 යි.) (මුළු ලකුණු 2 x 5 = 10)

(05) (i)
- නිෂ්පාදන ක්‍රියාවලිය
- නිෂ්පාදන ස්ථාවර වත්කම්
- නිෂ්පාදන පිරිවැය
- ඒකකයක පිරිවැය

(එක් කරුණකට ල. ½ බැගින් කරුණු 4 ට ල. 02 යි.)

(ii) යෙදවුම් ⟶ ක්‍රියාවලිය ⟶ නිමවුම්

(සුදුසු උදාහරණයක් දක්වමින් පැහැදිලි කර ඇත්නම් ල. 02 යි.)

(iii) ව්‍යාපරයට අවශ්‍යය වේයැයි අපේක්ෂා කරන මානව සම්පත පිළිබඳ තොරතුරු හා ඒ සඳහා වන පිරිවැය ඇස්තමේන්තු කර ගැනීමට. (ල. 02)

(iv) ද්‍රව්‍ය හා ද්‍රව්‍ය පිරුවැය සඳහා නිදසුන් ශ්‍රමය හා ශ්‍රම පිරිවැය සඳහා නිදසුන්
වෙනත් පිරිවැය සඳහා නිදසුන්
ඇතුලත් ඕනෑම අයිතම 4 ක් දක්වා ඇත්නම් එක් අයිතමයකට ½ බැගින් අයිතම 4 ට ල. 02 යි.

(v) ගැලපෙන පිළිතුරකට ½ බැගින් 4 ට ල. 02 යි. (මුළු ලකුණු 2 x 5 = 10)

(06) (i)
- පොදු අරමුණක් පැවතීම.
- සීමිත සම්පත් භාවිතය
- සාමූහික සම්බන්ධතාවයක් පැවතීම.
- ආර්ථික කටයුත්තක නියැලීම.
- පුද්ගල කණ්ඩායමක් ඒකරාශි වී සිටීම.

(එක් කරුණකට ල. 01 බැගින් කරුණු 2 ට ල. 02 යි.)

(ii)

හිමිකාරීත්වය මත ව්‍යාපර සංවිධාන
- පෞද්ගලික අංශයේ ව්‍යාපාර
- රාජ්‍ය අංශයේ ව්‍යාපාර

(ල. 01)

අරමුණ අනුව ව්‍යාපර සංවිධාන
- ලාභ අරමුණ කරගත් ව්‍යාපාර
- ලාභ අරමුණු කර නොගත් ව්‍යාපාර

(ල. 01)

(iii) හවුල්කරුවන් විසින් ඇතිකර ගන්නා ගිවිසුම්ගත ලිඛිත එකඟතාවය හවුල් ඔප්පුවකි. (ල. 02)

(iv)
- වරලත් හිමියා / වරලත්කරු
- වරලත්ලාභියා (එකකට 01 බැගින් ල. 02 යි)

(v)
- ව්‍යාපරයේ කීර්තිනාමය වර්ධනය වීම.
- ව්‍යාපාරයේ පැවැත්ම තහවුරු වීම.
- පැන නැගිය හැකි නීතිමය ප්‍රශ්න අවම වීම.

එක් පිළිතුරකට ල. 01 බැගින් ගැලපෙන පිළිතුරු 02 කට ල. 02 යි. (මුළු ලකුණු 2 x 5 = 10)

(07) (i)

මල්ෂාගේ ව්‍යාපාරය ½
ඇස්තමේන්තුගත මුදල් ප්‍රවාහ ප්‍රකාශය ½

අපේක්ෂිත මුදල් ගලා ඒම්		
අයිතිකරු යොදන මුදල	1 000 000 ½	
බැංකු ණය	200 000 ½	
අපේක්ෂිත විකුණුම් (අත්පිට)	900 000 ½	2 100 000 1
අපේක්ෂිත මුදල් ගලා යාම්		
ණය වාරික ගෙවීම	150 000 ½	
විදුලි බිල්පත් ගෙවීම	40 000 ½	
දුරකථන ගාස්තු	18 000 ½	
උපකරණ මිලට ගැනීම	200 000 ½	
සේවක වැටුප් ගෙවීම	300 000 ½	708 000 1
මුදල් ශේෂය		1 392 000

(ලකුණු 07)

(ii) මුදල් ශේෂය රු. 1 392 000/- (ල. 01)

(iii) තනි පුද්ගල ව්‍යාපාරයක ලක්ෂණ 04 ක් සඳහන් කර ඇත්නම් එක් ලක්ෂණයකට ½ බැගින් ල. 02 යි.

(මුළු ලකුණු 10)